අධ්‍යාපන හා උසස් අධ්‍යාපන
අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක: 1995/36

මගේ අංකය:- ද්වි. අ. /32
ද්විතීය අධ්‍යාපන දෙපාර්තමේන්තු,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

1995 දෙසැම්බර් මස 14 දින.

පළාත් අධ්‍යාපන ලේකම්
පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂ.

## අ. පො. ස. (සා. පෙළ) නව තාක්ෂණ විෂය නිර්දේශ

1996 අ. පො. ස. (සා.පෙ) පාඨමාලාව ආරම්භ කරන සිසුන් සඳහා (10 වසර) සංශෝධිත විෂය නිර්දේශය බලපැවැත්වෙන බැවින් පාසල් ප්‍රධානීන් විසින් තම පාසලට යෝග්‍ය විෂයයක් හෝ විෂයයන් හෝ තෝරා එම විෂයයට අදාල විෂය නිර්දේශය අනුව ඉගැන්වීම් කටයුතු කළයුතු බවට වග බලා ගත යුතුය.

02 1997 වර්ෂයේ පළමුවරට අ. පො. ස. (සා.පෙ) සඳහා පෙනී සිටින සිසුන් මෙම නව නිර්දේශ අනුව පරීක්ෂා කරනු ලැබේ. කෙසේ වෙතත් පැරණි නිර්දේශ යටතේ පෙනී සිටි සිසුන් එම නිර්දේශ අනුව පරීක්ෂා කරනු ලැබේ.

03 සංශෝධිත විෂයයන් හා නව විෂයයන් පහත දක්වේ.

කෘෂිකර්ම ක්ෂේත්‍රය

3.1 කෘෂිකර්මය
3.2 උද්‍යාන පාලනය
3.3 සත්ත්ව පාලනය
3.4 ගොඩකර ජලාශ ජීව සම්පත් තාක්ෂණය
3.5 සමුද්‍ර ජීව සම්පත් තාක්ෂණය
3.6 අහාර විද්‍යාව හා තාක්ෂණය

හස්ත කර්මාන්ත හා තාක්ෂණ කුසලතා ක්ෂේත්‍රය

3.7 ඉදිකිරීම් තාක්ෂණය
3.8 යාන්ත්‍රික තාක්ෂණය
3.9 කලා ශිල්ප
3.10 විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණය

ගෘහ ආර්ථික විද්‍යා ක්ෂේත්‍රය

3.11 ගෘහ ආර්ථික විද්‍යාව

04 වාණිජ විද්‍යා ක්ෂේත්‍රයට අයත් වාණිජ්‍ය හා ගිණුම් විෂයයද ලඝුලේඛණය හා යතුරු ලිවීම විෂයයද සංශෝධනය කර නොමැති අතර පවතින විෂයය නිර්දේශ තවදුරටත් ක්‍රියාත්මක වේ.

05 ඉහත 3 හි සඳහන් සියලුම විෂයයන්ට ප්‍රායෝගික වැඩ අනිවාර්යෙන්ම කර ඇති අතර, 1997 අ.පො.ස (සා.පෙ.) විභාගයට ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වේ.

06 ඔබේ විද්‍යාලේ දැනට සිටින තාක්ෂණික ගුරු භවතුන්ගේ හා දැනට තිබෙන උපකරණ, වැඩ කාමර, කෘෂි ඒකක ආදියේ උපරිම ප්‍රයෝජන ලබා ගන්නා පරිදි තාක්ෂණ විෂයය තෝරා ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු. තාක්ෂණ විෂය තෝරා ගැනීමේ දී ඔබට උපකාරීවන අත්වැලක් ඇමුණුමෙහි දක්වා ඇත.

අ.ක. /එම්. ඩී. ඩී. පීරිස්.
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ලේකම්.

යූ. එම්. අභයවර්ධන
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්
(ද්විතියික අධ්‍යාපන)

පිටපත

1 අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය
2 කොමසාරිස් ජනරාල් - විභාග දෙපාර්තමේන්තුව
3 කොමසාරිස් - ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව
4 සභාපති - ජාතික අධ්‍යාපන කොමිසම

# නව තාක්ෂණික විෂය නිර්දේශය

දැනට දිවයිනේ පාසල්වල විෂයයන් පහළොවක් උගන්වනු ලැබේ. (1991 අංක 41 චක්‍රලේඛය) ඉහත චක්‍රලේඛයෙහි සඳහන් වාණිජ්‍ය හා ගිණුම් විෂයයද ලඝුලේඛනය හා යතුරු ලිවීම යන විෂයය ද සංශෝධනය කර නොමැත. ඉතිරි විෂයයන් 13 සංශෝධනය කර ඇති අතර, නව විෂයයන් ද ඉදිරිපත් කර ඇත. විෂයයන් තෝරා ගැනීමේ දී පාසලේ තිබෙන සම්පත් ගැනද සලකා බැලිය යුතුය. තාක්ෂණික විෂයය තෝරා ගැනීමේදී උපකාර විය හැකි නිර්දේශ පත්‍රයේ අඩංගු ප්‍රධාන මාතෘකා පහත දක්වේ. නව තාක්ෂණික විෂයයන්

01 කෘෂිකර්ම ක්ෂේත්‍රය

1.1 කෘෂිකර්මය

- කෘෂිකාර්මික මූලධර්ම
- බෝග වගාව
- අපනයන කෘෂිකර්ම බෝග වගාව
- සත්ත්ව පාලන මූලධර්ම
- පෝෂණ විද්‍යාව හා ආහාර සහ වෙනත් කෘෂි නිෂ්පාදන සංරක්ෂණය
- කෘෂිකර්මයෙන් පරිසරයට වන හිතකර හා අහිතකර බලපෑම්

1.2 උද්‍යාන විද්‍යාව

- කෘෂිකර්ම මූලධර්ම
- තවාන් පාලනය
- ශාක ප්‍රචාරණය
- මල් හා විසිතුරු ශාක වගාව
- ගෙවතු උයන් සැකසීම
- මී මැසි පාලනය
- උද්‍යාන පාලනය හා පරිසර සංරක්ෂණය

1.3 සත්ත්ව පාලනය

- කෘෂිකාර්මික මූලධර්ම
- සත්ත්ව පාලන මූලධර්ම
- කුකුළු පාලනය
- ගව පාලනය
- වෙනත් ගොවිපල සතුන් පාලනය

1.4 සමුද්‍රජීව සම්පත් තාක්ෂණය

- සමුද්‍ර ජීව සම්පතෙහි ආර්ථික හා සමාජීය වැදගත්කම
- සමුද්‍ර ජීව සම්පත් කෙරෙහි බලපාන සාධක
- සමුද්‍ර ජීව සම්පත් වර්ගීකරණය
  - සමුද්‍ර ශාක සම්පත්
  - මත්ස්‍ය නොවන සමුද්‍ර සත්ත්ව සම්පත්
  - මත්ස්‍ය සම්පත
- ශ්‍රී ලංකාවේ සමුද්‍ර ජීව කර්මාන්තය, නිෂ්පාදනය හා අලෙවිය.
- තාක්ෂණික ක්‍රම හා ආම්පන්න
- ආශ්‍රිත සුළු කර්මාන්ත හා අතුරු නිෂ්පාදන

1.5 ගොඩකර ජලාශ ජීව සම්පත් තාක්ෂණය

- ගොඩකර ජලාශ ජීව සම්පත් කර්මාන්තයේ ආර්ථික වටිනාකම
- මත්ස්‍ය සම්පත

- ජලජ ශාක සම්පත
- මසුන් ජීවත් වන ස්ථාන
- මත්ස්‍යයන් ඇති කිරීම
- මත්ස්‍ය රෝග පලිබෝධ හා ඒවා වළක්වා ගැනීම
- මත්ස්‍ය නිෂ්පාදනය හා ඊට අවශ්‍ය ආම්පන්න
- මසුන් පරිහරණය හා කල්තබා ගැනීම
- විසිතුරු මසුන් සහ විසිතුරු ජලජ ශාක

1.6 ආහාර විද්‍යාව හා තාක්ෂණය

- ශ්‍රී ලංකාවේ හමුවන දුෂ්පෝෂණ තත්ත්ව
- ලෝක ජනගහනය හා ආහාර අර්බුදය
- කෘෂිකාර්මික හා සත්ත්ව පාලන මූලධර්ම
- අස්වැන්න හා අස්වනු හානිවන ආකාර
- ආහාර නරක් වීමට හේතුවන කරුණු
- ආහාර සංරක්ෂණ මූලධර්ම හා ක්‍රියා පිළිවෙත්

02 හස්ත කර්මාන්ත හා තාක්ෂණ කුසලතා ක්ෂේත්‍රය

2.1 ඉදිකිරීම් තාක්ෂණය

- ලී වැඩ
- ගොඩනැගිලි වෘත්තීය
- ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම

2.2 යාන්ත්‍රික තාක්ෂණය

- ලෝහ කර්මාන්ත
- මෝටර් කාර්මික ශිල්පය
- ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම

2.3 කලා ශිල්ප

- විවීම
- සෙරමික් තාක්ෂණය (මැටි ශිල්පය)
- විසිතුරු අත්කම්
- ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම

2.4 විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණය

- විදුලිය
- ගුවන් විදුලි කාර්මික ශිල්පය
- ඉලෙක්ට්‍රොනික තාක්ෂණය
- ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම

03 ගෘහ ආර්ථික විද්‍යා ක්ෂේත්‍රය

3.1 ගෘහ ආර්ථික විද්‍යාව

- ගෘහ පාලනය
- ආහාර හා පෝෂණය
- රෙදිපිළි හා ඇඳුම් තැනීම
- බාලක සංවර්ධනය

ඉහත සඳහන් නව විෂයය නිර්දේශ ජාතික අධ්‍යාපන ආයතනය මගින් නිකුත් කරනු ලැබේ.